**ශීර්ෂය 427 - පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 30 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 20 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 3,349,194 ක් හා අත්තිකාරම් ලැබීම් වටිනාකම රු. 13,618,831 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත අනුව (SA-52) මුළු අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 48,456,526 ක් හා අත්තිකාරම් ලැබීම් වටිනාකම රු. 6,714,036 ක් විය. ඒ අනුව පිළිවෙලින් රු. 45,107,332 ක හා රු. 6,904,795 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම අමාත්‍යාංශයේ 2020 වර්ෂයේදී අගෝස්තු දක්වා කාලයේ අමාත්‍යාංශ 2ක් සමඟ එ්කාබද්ධව පැවති අතර සැප්තැම්බර් 01 දින සිට රාජ්‍ය අමාත්‍යාංශයක් ලෙස ශීර්ෂ අංක 427 යටතේ ස්ථාපිත විය. ඒ අනුව 2020 ජනවාරි-අගෝස්තු දක්වා කාලයට අදාල අත්තිකාරම් ගිණුම් හර සහ බැර ශේෂයන් 427-0-12 යටතේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මාරු කිරීමේදී පෙර පැවති අමාත්‍යාංශ දෙකෙහි අප අමාත්‍යාංශය කාර්ය මණ්ඩලයට අදාල මුලු ශේෂයම 427 ශීර්ෂය වෙත මාරු කර ඇත. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත (SA-52) හි 427-0-12 යටතේ දැක්වෙන්නේ පෙර අමාත්‍යාංශ 02කට අයත් අත්තිකාරම් ගිණුම් ශේෂයන් ගේ එකතුවයි. එමෙන්ම භාණ්ඩාගාර මුද්‍රිත 427-0-11 යටතේ දක්වා ඇත්තේ 2020 වර්ෂයේ සැප්තැම්බර් - දෙසැම්බර් යන මාස 04කට අදාල ශේෂයන් පමණි. | 2020 අගෝස්තු 28 දින අංක 02/2020 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වේ. |
| (ආ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව තැන්පත් ගෙවීම් වටිනාකම රු. 670,908 ක් ද සහ තැන්පතු ලැබීම් 2,127,245 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත අනුව (SA–30) තැන්පතු ලැබීම් රු. 23,869,243 ක් හා තැන්පතු ගෙවීම් රු. 22,412,906 ක් බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන අමාතයාංශය සමග ඒකාබද්ධ වී කටයුතු කළ අතර 2020.09.01 සිට අප තනි අමාත්‍යාංශයක් ලෙස ( ශීර්ෂ අංක 427) යටතේ කටයුතු කරන ලදි. අප අමාත්‍යාංශයට (427 ශීර්ෂයට) අයත්ව ඇත්තේ පොදු තැන්පත් ගිණුම් දෙකක් වන අතර ඒවා 6000 – 13 - 170 හා 6000-16-141 වේ. එම අංක දෙකට අදාල තැන්පත් ලැබීම හා ගෙවීම් පමණක් අපගේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇති බව සඳහන් කරමි. | -එම- |
| (ඇ) | භාණ්ඩාගාර මුද්‍රිත (SA – 52) අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 48,456,527 ක් වුවද අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 1,310,316 ක් විය. ඒ අනුව ගැලපුම් ගිණුමට රු. | මෙම අමාත්‍යාංශය 2020 අගොස්තු දක්වා කාලයේ අමාත්‍යාංශ **2** ක් සමග ඒකාබද්ධව පැවති අතර සැප්තැම්බර් 1 දින සිට රාජ්‍ය අමාත්‍යාංශයක් ලෙස ශීර්ෂ අංක 427 යටතේ ස්ථාපිත විය. ඒ අනුව 2020 ජනවාරි -අගෝස්තු දක්වා කාලයට අදාල අත්තිකාරම් ගිණුමේ හර හා බැර ශේෂයන් 427-0-12 යටතේ රාජ්‍ය | -එම- |

| | |
|---|---|
| 47,146,211 ක් ගැලපිය යුතු වුවත් රු. 2,038,877 ක් ගලපා තිබුණි. එමෙන්ම භාණ්ඩාගාර මුද්‍රිත අනුව (SA – 52) අත්තිකාරම් ලැබීම් වටිනාකම රු. 6,714,036 ක් වුවද අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව වටිනාකම රු. 4,213,051 ක් විය. ඒ අනුව ගැලපුම් ගිණුමට රු. 2,500,985 ක් ගැලපිය යුතු වුවත් ගැලපුම් ගිණුමට රු. 9,405,779 ක් ගලපා තිබුණි. | ගිණුම් දෙපාර්තමේන්තුව යටතේ මාරු කිරීමේ දී අමාත්‍යාංශ 2 හි අප අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට අදාල මුලු ශේෂයම 427 -0-12 ශීර්ෂය වෙත මාරු කර ඇත. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත (SA 52) හි 427-0-11 යටතේ දක්වා ඇත්තේ 2020 වර්ෂයේ සැප්තැම්බර්-දෙසැම්බර් යන මාස 4 ට අදාල ශේෂයන් පමණි. 427 ශීර්ෂය යටතේ සිගාස් වැඩසටහනේ ඇතුලත් කරන ලද දත්ත මත පදනම් කර ගනිමින් අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් ශේෂයන් ගණනය කර එම ශේෂයන් සහ ශේෂ පිරික්සුම අතර වෙනස අක්මුදල් ගිණුමට ගලපා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයෙහි වාහන පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත් කර ඇති අතර කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, විද්‍යුත් උපකරණ, සන්නිවේදන උපකරණ, ගෘහභාණ්ඩ යන වත්කම් පිළිබඳ තොරතුරු ඇතුලත් නොවූ හෙයින් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ වෙනත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම වන රු. 20,452,492 අගය තහවුරු කර ගැනීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතින බව සඳහන් කරමි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතු වේ. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව මගී වාහන වල මුළු වටිනාකම රු. 585,743,693 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනයට අනුව මගී වාහන වල මුළු වටිනාකම රු. 576,921,050 ක් වුයෙන් රු. 8,822,643 ක වෙනසක් නිරීක්ෂණය විය | අදාල වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු අතර නිවැරදිව වත්කම් ගිණුම්ගත කල යුතු වේ. |
| (ඇ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව වර්ෂය තුල කාර්යාල උපකරණ මිලදී ගැනීම් රු.55,000 ක් දක්වා තිබු නමුත් වියදම් වර්ගීකරණයට අනුව ඒසීඒ 2 (ii) යටතේ එම වියදම රු.870,000 ක් වුයෙන් රු. 825,000 ක වෙනසක් නිරීක්ෂණය විය | මෙම මිලදී ගැනීම මහ භාණ්ඩාගාරය වෙත ගිණුම් සාරාංශ මගින් දන්වා යැවුයේ 2021 ජනවාරි පළමු පරිපූරක ගිණුම් සාරාංශය මගින් | වර්ෂයට අදාලව දරන ලද ප්‍රාග්ධන වියදම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ නිවැරදිව දැක්විය යුතු වේ. |

.

| | | |
|---|---|---|
| | බැවින් එම රු.825,000 ක ප්‍රමාණය මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශයේ අවසාන (2020.12.31) ගිණුම් ශේෂය තුළ ඇතුළත් වී ඇත. | |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වශයෙන් රු. 124,981,407 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු. 125,367,300 ක් වුයෙන් රු. 385,893 ක වියදම් වැඩියෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට එකතුවිය යුතු රු.585,893/- ක මුදල මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට එකතු කිරීම නිසා මෙම අඩුපාඩුව සිදුවී ඇත. | 2020 අගෝස්තු 28 දින අංක 02/2020 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වේ. |
| (ආ) අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම් වියදම රු. 41,060,139 ක් වුවද මුදල් ප්‍රවාහයේ එම වටිනාකම රු. 40,674,246 ක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් රු. 385,893 ක වියදම් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට එකතුවිය යුතු රු.585,893 ක මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට එකතු කිරීම නිසා මෙම අඩුපාඩුව සිදුවී ඇත. | -එම- |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ස්ථාවර වත්කම් ලේඛනය** 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් | අදාල ලේඛන යාවත්කාලීන කිරීමට අදාල විෂය භාර නිලධාරීන් දැනුවත් | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලිනව පවත්වා |

| | | | |
|---|---|---|---|
| | රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි* පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | කර ඇති බව දන්වා සිටිමි. | ගත යුතුය |
| (ආ) | **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | -එම- | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලිනව පවත්වා ගත යුතුය |
| (ඇ) | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනයඅ**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීමට ද දැනට කටයුතු කරමින් පවතින බව ද දන්වා සිටිමි | රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීමට ද දැනට කටයුතු කරමින් පවතින බව ද දන්වා සිටිමි | බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය |
| (ඉ) | **උප පත්‍රිකා පොත් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීමට ද දැනට කටයුතු කරමින් පවතින බව ද දන්වා සිටිමි | උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------- | -------------- |
| මුලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරිමේදී වැය විෂයන් 08 ක විචලතාවය ඍණ සියයට 172 සිට ධන සියයට 100 අතර පරාසයක් වෙනස් වී තිබූ බව නිරික්ෂණය විය . | පිළිතුරු ලබාදි නොමැත | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු සකස් කල යුතු වේ. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------ | ------------ |
| **2020** ප්‍රතිපාදන ඉතිරිවීම් සම්බන්ධයෙන් කටයුතු කිරිමකින් තොරව වැය විෂයන් **11** ක් සඳහා රු 15,420,696 ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා බැඳීම ඇතිකරගෙන තිබූ බව නිරීක්ෂණය විය . | ඉදිරියේ දී මෙවැනි තත්වයන් අවම කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි**.** | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව<br>ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳීම් වැලැක්වීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වේ. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------ | ----------- |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්**,** එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්**,** එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රගතිය ඇගයීමේ රැසවීම්, අභ්‍යන්තර විගණන නිරීක්ෂණ ලබා ගැනීම වැනි ක්‍රමයන් යොදා ගත් බව පෙන්වා දෙන අතර ඒ තුළින් අමාත්‍යාංශයේ සඵලදායී මූල්‍ය පාලනයක් ඇති කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්**,** වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාලව රජයේ වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැයක් ඉදිරිපත් නොවන නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හෝ ඒ අනුව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කිරීම අපහසුවිය. 2020 ජනවාරි මස සිට අප්‍රේල් දක්වා අතුරු සම්මත ගිණුම පදනම් | -එම- |

| | | |
|---|---|---|
| | කරගෙන ග්‍රාමීය සංවර්ධන අංශය සඳහා විගණන සැලැස්මක් සකස් කරන ලදී. | |

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ---------------------------------------- | ------------ |
| සේවය හැරගිය නිළධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු වසර පහට වඩා වැඩි ණය ශේෂ රු.99,450 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV ජේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. මියගිය නිළධාරීන්ගෙන් අයවිය යුතු අවුරුද්දට වැඩි ණය ශේෂයන් වන රු. 152,745 අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV ජේදයේ 4.4 වගන්තිය අනුව ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සේවය අතහැර ගිය නිලධාරීයෙකුගේ රු.36,930.00 ක ණය ශේෂය පොත්වලින් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. සේවය හැර ගිය නිලධාරීයෙකුගේ රු. 62,519.49 ක ආපදා ණය ශේෂය අය කර ගැනීම සඳහා ඇපකරු ලෙස ඉදිරිපත් කර ඇති, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත දැනුම් දී ඇත | ආයතන සංග්‍රහයේ XXIV ජේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කර ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හදුන්වා දිය යුතු වේ. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------- | | | |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ----------------------- | ------------ |
| ------------------------------ | ----------------- | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 (5) | මාණ්ඩලිකව නොවන නිළධාරීන් සඳහා වටිනාකම රු 130,600 ක් වූ අතුරු අග්‍රිම නිකුත්කළ අවස්ථා 03 ක් නිරීක්ෂණය විය.<br>තවද අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අතුරු අග්‍රිම ය නැවත පියවිය යුතු වුවත් දින 60 | කොරෝනා වසංගතය පැවති මෙම සීමාවේදී අතුරු අග්‍රිම ලබාදුන් කටයුතු ක්‍රියාත්මක කිරීම හා පියවීම් කටයුතු ප්‍රමාද වීම් සිදු වූ බව දන්වා සිටින අතර මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අතුරු අග්‍රිම ය නැවත පියවිය යුතු |

| | | | |
|---|---|---|---|
| | සිට දින 295 දක්වා දක්වා කාල ප්‍රමාදයකින් යුතුව නැවත පියවීම් සිදුකර ඇති වටිනාකම රු 397,100 ක් වූ අවස්ථා 12 ක් නිරීක්ෂණය විය. | නොවීමට කටයුතු කරන බව දන්වා සිටිමි.එසේම මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා අතුරු අග්‍රිම ලබා නොදීමට ඉදිරියේ දී කටයුතු කරන බව ද සඳහන් කරමි | වීම. |
| (ii) මුදල් රෙගුලාසි 570 (2) | වසර 02 ක් ඉක්මවා ඇති වටිනාකම රු. 21,679,283 වූ තැන්පතු 04 ක් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන පැවතිණි. මෙම තැන්පතු මුදල් මෙම අමාත්‍යාංශය විෂය සීමාවට මේ වනවිට ඇතුලත් වී නොමැති ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරිමේ ව්‍යාපෘති වෙනුවෙනි. | නව අමාත්‍යාංශයේ තැන්පත් ගිණුමට පවරා දීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බවට සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව 570 (2) තැම්පත් කල දින සිට වර්ෂ 02 ක කාලපරිච්ජේද තුල හිමිකම් නොපාන තැම්පත් ඉකුත් තැම්පත් ලෙස සලකා රාජ්‍ය ආදායමට බැර කිරිමට කටයුතු කල යුතු වේ. |
| (ඇ) (iii) මුදල් රෙගුලාසි 396 (අ) , (ආ) , , (ඇ) | මාස 06 වැඩි කාලයක් මුදල් නොකල රු.1,870,423 ක් වූ චෙක්පත් 48 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබීණි. | මේ වන විට මුදල්රෙගුලාසි ප්‍රකාරව අදාල කටයුතු සියල්ල ඉටු කර ඇත | මුදල් රෙගුලාසිය ප්‍රකාරව වලංගු කාලය අවසන් වූ චෙක්පත් සම්බන්ධව කටයුතු කල යුතු වේ. |
| (iv) මුදල් රෙගුලාසි 104(3) | වාහන හදිසි අනතුරු සිදුවූ පසු ඒ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාව දින 07 ක් ඇතුළත ඉදිරිපත් කල යුතු වුවත් 2020 ඔක්තෝබර් 04 වන දින අංක KX – 8135 දරන වාහනයට සිදුවූ අනතුර පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව 2021.03.01 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මූලික පරීක්ෂණය පැවැත්වීම සඳහා කමිටුවක් පත් කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව වාහන හදිසි අනතුරු සිදුවූ පසු ඒ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාව දින 07 ක් ඇතුළත ඉදිරිපත් කල යුතු වේ. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 4.3 වැනි ජේදය. | වාහනයක කොටස් ගැලවූ පසු ගරාජයේ මිල ගණන් පිළිගැනීමට සිදුවන අතරම ඉදිරිපත් කරන ලද මිල ගණන් වල සාධාරණත්වය සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ දෙපාර්තුමේන්තුවක, සංස්ථාවක | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂක ආර්.ආර්.පී.ඩබ්.එම්.ආ ර්.සී.ටී.බී. ගලගොඩ | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | හෝ මණ්ඩලයක සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවකුගේ වාර්තාවක් ලබාගත් යුතු වුවත් අංක PA - 1440 දරණ වාහනය පිළිබද එසේ කටයුතු කර නොතිබුණි. | මහතා 2018.11.16 දින මාතර ගරාජ් ආයතනය වෙත ගොස් රථය පරීක්ෂා කර බලා වාහනයේ එන්ජිම අළුත්වැඩියා කර නැවත ධාවනය කිරීම ආර්ථික වශයෙන් ඵලදායී වේ නම් පමණක් අදාළ එන්ජින් අළුත්වැඩියාව සිදු කිරීම ඔහුගේ 2018.11.21 දිනැති ලිපිය මඟින් නිර්දේශ කර ඇත | |
| **(ඇ)** 2020.10.02 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 5 / 2020 02 (අ) | (i) | ධාවන තත්වයේ නොපවතින වාහන 2020.12.31 දිනට පෙර අපහරණය කළ යුතු වුවත් 251-0747 , JR - 2899 , හා 65-6120 යන ධාවනයට නුසුදුසු තත්වයේ පවතින වාහන 03 ක් අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර පැවතිණි . | අංක 251- 0747 දරණ වෑන් රථය 2021 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අලුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි වාහන 2 අපහරණය කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | -එම- |
| | (ii) | අපහරණය කිරිම සදහා සුදුසු වාහන හඳුනාගැනීමෙන් පසුව අළුත්වැඩියා කර භාවිතා කිරිම ඵලදායි ලෙස හඳුනාගනු ලබන දැනට ධාවන තත්වයේ නොමැති වාහන සම්බන්ධයෙන් කටයුතු කර 2020.12.31 දිනට පෙර අළුත්වැඩියා කළ යුතු විය. එහෙත් KQ –8444, KQ – 9375 යන වාහන 02 සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබීම නිසා 2021 මාර්තු 01 වන විටත් ඌන උපයෝජිතව පැවතිණි. | අංක KQ – 8444 රථය නැවත වියදම් ඇස්තමේන්තුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.<br>KQ – 9375 - අයිතිය නීත්‍යානුකූලව ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දී ඇත | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------------------- | ----------- |
| (අ) | අනුමත ක්‍රියාකාරී සැලැස්මෙහි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 චක්‍රලේඛයේ 03 ඡේදයට අනුව යාවත්කාලීන කරන ලද ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදි සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අරමුදල් අවශ්‍යතා සැලැස්ම යන තොරතුරු අන්තර්ගත වී නොතිබිණි. | 2020 වර්ෂයට අදාලව ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇති බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස්කල යුතු වීම |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මෙහි එළු පොකුරු ගම්මාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත්වී නොතිබුණද ප්‍රගති වාර්තාවෙහි නැගෙනහිර, උතුර හා දකුණ පලාත්වල දිස්ත්‍රික්ක 4 ක රු.මි 4.13 ක් ඒ සඳහා අයෝජනය කර ඇති බව දක්වා ඇත. | මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත්තේ කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ බැවින් අප අමාතයාංශයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති බව දන්වා සිටිමි. | -එම- |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම තුල සෑම වැඩසටහනක් සඳහාම ඉලක්කගත කාල සීමාව 2020 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 ලෙස දක්වා තිබුණද එක් එක් වැඩසටහන්/ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සහ අවසන් කිරීමට අපේක්ෂිත නිශ්චිත දිනයන් හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය. | එක් එක් වැඩසටහන යටතේ දක්වා ඇත්තේ එකිනෙකට සමගාමීව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් බව සඳහන් කරමි. | -එම- |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරිම වැඩසටහන් යටතේ කාන්තාවන් සවිබල ගැන්වීම තුලින් නිෂ්පාදනය ඉහළ නැංවිමේ ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන මගින් රු.මි. 3.67 ක් ලැබී තිබුණු අතර ඉන් රු.මි. 1.67 ක් එනම් සියයට 45.5 වැයකර ඇතත් අත්කරගත් භෞතික ප්‍රගතිය සියයට 30 ක් විය | 2020 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 3.70 ක් ලැබුණි. 2020.12.31 වන විට රුපියල් මිලියන 3.63 ක් වියදම් කර ප්‍රතිලාභීන් 80 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ප්‍රගතිය සියයට 100 කි. | නියමිත කාලවකවානුව තුල ව්‍යාපෘතිය ඉටුකිරීමට හැකි වන අයුරින් සැලසුම් විධිමත් පරිදි සැලසුම් පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සූකර කර්මාන්ත සංවර්ධන වැඩසටහන සඳහා අස්තමේන්තුගත කරන ලද රු.මි. 10 ක් සඳහා අයවැය ප්‍රතිපාදන ලෙස රු.මි. 2.44 ලැබී ඇති අතර ඉන් රු.මි. 1.54ක් හෙවත් සියයට 63 ක් වැයකර ඇතත් අත්කරගත් භෞතික ප්‍රගතිය සියයට 45 ක් බව නිරීක්ෂණය විය. | Covid 19 තත්වය හේතුවෙන් පළාත් අධ්‍යක්ෂකවරුන් විසින් කළ යුතු මූලික කටයුතු කර ගැනීම සඳහා කාල වේලා නොතිබුණ බැවින් වසරේ මුල් කාර්තුවේ ලබා දුන් ඉලක්ක අනුව රුපියල් මිලියන 1.10 වැය කර ප්‍රතිලාභී ගොවිපොළ 22 ක් පමණක් සම්පූර්ණ කිරීමට හැකි විය. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 45 කි. | සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර නියමිත කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් ඇතිකිරිම සඳහා අයවැය ප්‍රතිපාදන ලෙස රු.මි. 2.78ක් ලැබී ඇති අතර වැය කර ඇති මුදල රු.මි. 3.28 ක් බැවින් ප්‍රතිපාදන ඉක්මවා වැයකර ඇති මුදල රු.මි. 0.5 කි. එසේ වුවද මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කර ඇති රු.මි. 2.6 ක උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 2.80 ප්‍රතිපාදන මුදලක් පමණක් ලැබුණි. 2020 දෙසැම්බර් 31 දිනට වියදම රුපියල් මිලියන 2.704 ක් බව දන්වමි. ඒ අනුව ප්‍රතිපාදන ඉක්මවාගොස් නොමැති බව දන්වා සිටිමි. | -එම- |
| (ඈ) | අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ ගොවිපොළවල් ස්ථාපිත කිරීම සඳහා රු.මි. 39.5 ක්ද කාර්යසාධනය මැන බැලීම සඳහා රු.මි. 0.5 ක්ද වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම තුල රු.මි. 40 ක් ඇස්තමේන්තු කර තිබු නමුත් ප්‍රගති වාර්තාවෙහි දක්වා ඇත්තේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු.මි. 7.5 ක් ලෙස බැවින් රු.මි. 32.5 ක වෙනසක් | 2020 වර්ෂය සඳහා වෙන් වීතිබූ ප්‍රතිපාදන ප්‍රමාණය මිලියන 40කි. එහෙත්. පළමු අතුරු සම්මත ගිණුම මගින් වෙන් කර තිබුණේ මිලියන 8.0ක් පමණක් බැවින් ඉලක්ක සකසන ලද්දේ එම ප්‍රමාණයට පමණි.<br>පළමු අතුරු සම්මත ගිණුම මඟින් මිලියන 8.0 ක මුදලක් වෙනුකරනු ලැබූවද දෙවන අතුරු සම්මත ගිණුමෙන් වෙන්කර තිබුණේ රු.මි. 0.5 ක් හා | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තා සකස්කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය විය. තවද අයවැය ප්‍රතිපාදන ලෙස රු. මි. 3.23 ක් ලැබී ඇති අතර එම ප්‍රතිපාදන වලින් රු.මි. 1.23 ක් හෙවත් සියයට 38 ක් වැයකර අත් කරගත් භෞතික ප්‍රගතිය සියයට 25 ක් බව දක්වා ඇතත් එම භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිලිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොවිණි. | තුන්වන අතුරු සම්මත ගිණුමෙන් මිලියන 3.25 ක් පමණි. Covid-19 තත්වය මත සියලු වැඩ අවසන් කිරීමට නොහැකි වූ අතර, ගොවිපොල 75ක් සෑදීමට ඉලක්ක කලද අවසානයේදී නිමකර අවසන් කරන ලද්දේ ගොවිපොල 55ක් පමණක් බවත් වර්ෂ අවසානයේ මූල්‍ය ප්‍රගතිය මිලියන 1.23 නොව රුපියල් මිලියන 5.47 ක් බවත් දන්වා සිටිමි. | |
| (ඉ) | දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරිමේ වැඩසටහන සඳහා රු.මි. 50 ක් ඇස්තමේන්තු කර ව්‍යාපෘතින් 3ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණද ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවෙහි ඇතුළත් කර ඇත්තේ කාන්තාවන් සවිබල ගැන්වීම් තුලින් කිරි නිෂ්පාදන ඉහල නැංවීමේ ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පමණක් විය. එම ව්‍යාපෘතියෙහිද ප්‍රගතිය පිළිබඳ නිශ්චිත තොරතුරු ඇතුලත් නොවුණ බව නිරීක්ෂණය විය. තවද මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ප්‍රගති වාර්තාවෙහි අන්තර්ගත නොවූ බැවින් එම ව්‍යාපෘතිවල ප්‍රතිපාදන උපයෝජනය, භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනය කල නොහැකිය විය. | දියර කිරි පරිභෝජන වැඩසටහන යටතේ 2020 වර්ෂය සඳහා වෙන් වීමට නියමිතව තිබුණේ රු. මිලියන 50කි. එසේම ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, අනපේක්ෂිත ලෙස ඇතිවූ Covid-19 තත්ත්වය හේතුවෙන් පාසල් ළමුන් අතර දියර කිරි ප්‍රචලිත කිරීමේ තරඟය පැවැත්වීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යන ව්‍යාපෘතිය දෙකම අවලංගු කරන ලදී. ඒ අනුව පළමු හා දෙවන අතුරු සම්මත ගිණුමෙන් ලද රු. මිලියන 8.5ක ප්‍රතිපාදන කාන්තාවන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ලදී. එසේම, මෙම ව්‍යාපෘතිය සඳහා ආරම්භයේ දී ප්‍රතිලාභීන් 225 දෙනෙකු ඉලක්ක කලද අතුරු සම්මත ගිණුම අනුව ලද මුදල් අනුව ප්‍රතිලාභීන් 80 දෙනෙකු සඳහා යෙදවුම් ලබාදීමට කටයුතු කරන ලදී. ඒ අනුව මෙහි භෞතික ප්‍රගතිය සියයට 100 ක් බවද දන්වා සිටිමි. | එක් එක් වැඩසටහන යටතේ වූ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රගතිය මිනුම් කල හැකි පරිදි හා සන්සන්දනය කල හැකි පරිදි ප්‍රගති වාර්තා හා ක්‍රියාකාරී සැලස්ම ඉදිරිපත් කළ යුතු වේ. |
| (ඊ) | බඩල්ගම නව කිරි සැපයුම් මධ්‍යස්ථාන ස්ථාපිතකිරිම සඳහා රු.මි. 300 ක් ඇස්තමේන්තු කර ඇති අතර ඉන් රු.මි. 262.3 ක් අයවැය ප්‍රතිපාදන මගින් ලැබී ඇතත් වැය කර ඇත්තේ රු.මි. 74.91 ක් බැවින් ප්‍රතිපාදන ඉතිරිවීම් රු.මි. 187.39 හෙවත් සියයට 71.44 ක් බව නිරීක්ෂණය විය | 2020 වර්ෂයේදී බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් විදෙස් අරමුදල් ප්‍රතිපාදන යටතේ (12) රුපියල් මිලියන 58.60 ක් වියදම්ව ඇති අතර, දේශීය අරමුදල් ප්‍රතිපාදන (17) යටතේ ව්‍යාපෘතියෙහි ආනයනයනට අදාළ බදු මුදල් ගෙවීම සහ දේශීය ඉදි කිරීම් වලට අදාළ බදු (VAT) ගෙවීම් ප්‍රතිපූර්ණය වෙනුවෙන් 2020 වර්ෂය තුළ රුපියල් මිලියන 16.31 ක වියදමක් දරා ඇත.<br>උද්ගතවූ Covid 19 වසංගත තත්වය හේතුවෙන් දිවයිනට යන්ත්‍රෝපකරණ | ව්‍යාපෘතිය ඉටුකිරීමට හැකි වන අයුරින් සැලසුම් විධිමත් පරිදි සැලසුම් පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |

අන්තර්ගත බහාලුම් ආනයනය සහ ඩෙන්මාර්ක් ජාතික විශේෂඥයින්ට දිවයිනට ලඟා වීමට ඇතිවූ සීමා හේතුවෙන් ව්‍යාපෘතියෙහි ඉදි කිරීම් සහ සවි කිරීම් කටයුතු සීමා කිරීමට සිදු විය.

**3.3 පාඩු හා හානි**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 107 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් රු. 335,419 ක් වූ 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ හානි හා පාඩු වටිනාකම අදාල වගකිවයුතු පාර්ශවන්ගෙන් අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | පාඩු හා හානි ලෙස දක්වා ඇති මුදලින් මේ වන විට රු.94,702 ක මුදලක් වගකිවයුතු රියදුරන්ගේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල මඟින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර රු. 45,450 මුදලක් අදාල වගකිවයුතු රියදුරන් ගෙන් අයකරගෙන ඇත. ඉතිරිය පොතෙන් කපා හැරීමටත් කටයුතු කරනු ලැබේ. | හානි හා පාඩු වටිනාකම අදාල වගකිවයුතු පාර්ශවන්ගෙන් අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට කටයුතු කල විය යුතු වීම. |

**3.4 කළමනාකරණ දූර්වලතා**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2021 අප්‍රේල් මස 09 වන දින වන විටත් ඒවා විගණනයට ඉදිරිපත් නොවූ හෙයින් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වටිනාකම රු. 606,196,184 ක් වූ වත්කම් භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | පිළිතුරු ලබාදි නොමැත | 2020 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2014 පෙබරවාරි 19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි (03) වන ජේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුල වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් විය යුතු වුවත් 2020 වර්ෂය | 2020 වර්ෂයට අදාලව රජයේ වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැයක් ඉදිරිපත් නොවන නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හෝ ඒ අනුව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කිරීම අපහසුවිය. 2020 ජනවාරි මස සිට අප්‍රේල් දක්වා අතුරු සම්මත ගිණුම පදනම් | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුල වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් විය යුතු වීම. |

| | | |
|---|---|---|
| වෙනුවෙන් අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කර තිබුනේ පළමු කාර්තුව සඳහා පමණක් බව නිරීක්ෂණය විය. | කරගෙන ග්‍රාමීය සංවර්ධන අංශය සඳහා විගණන සැලැස්මක් සකස් කරන ලදී. | |

**4.2 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු විසින් ආයතනයෙහි ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පදනමක් මත සමාලෝචනය කළ යුතු බව දන්වා තිබුණ ද 2020 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි | ඇදිරිනීතිය ක්‍රියාත්මක කිරීම හා කොවිඩ් වසංගත තත්වය නිසා රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව කාරුණිකව දන්වමි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු විසින් ආයතනයෙහි ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පදනමක් මත සමාලෝචනය කළ යුතු වීම. . |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙහි අනුමත තනතුරු 457 න් තනතුරු 33 ක් පුරප්පාඩුව පැවතිණි. එහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ 09 ක්ද තෘතීය මට්ටමේ එක් තනතුරක්ද පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු තනතුරු 09 අතුරෙන් තනතුරු 03 ක් සඳහා නිලධාරින් පත් කිරීමට නියමිතව ඇති අතරතවත් තනතුරු 04 ක් සඳහා පුරප්පාඩු පවතින බවත් ඒ සඳහා අවශ්‍යය කටයුතු සිදුකරන ලෙස රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා කෘෂිකාර්මික අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇත. තවත් එක් තනතුරක් සඳහා පූර්ණකාලීනව රාජකාරි ඉටු කිරීමට නිලධාරියෙකු පත් කර ඇති අතර ඉතිරි තනතුර සඳහා මෙතෙක් නිලධාරින් පත් කර නොමැත. මෙම අමාත්‍යාංශයේ විෂය ක්ෂේත්‍රයට, එම තනතුරට අදාලව සැලකිය යුතු මට්ටමේ කාර්යයන් ඇතුළත් නොවීම ඊට හේතු වී ඇත බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇත.<br><br>එමෙන්ම තෘතීය මට්ටමේ පරිපාලන නිලධාරි තනතුරට පුරප්පාඩුව පවතින බව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇත ඇතත් මෙතෙක් එම තනතුර සඳහා නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නැත. | රාජකාරි නිසිපරිදි ඉටු කිරීමට ප්‍රමාණවත් සේවක පිරිසක් අමාත්‍යාංශය තුල රඳවා ගැනීමට හැකි වන සේ අවශ්‍යවන කාර්යමණ්ඩලය ඉක්මනින් බඳවා ගැනීම කළ යුතු වීම. |